[සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)
## 04 ශ්‍රේණිය
## (04) සංස්කෘත - I පත්‍රය

| 04 | S | I |
|---|---|---|

පැය එකයි.

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
* අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ඌෂ්මන් අක්ෂර පමණක් ඇති වරණය වන්නේ,

(1) ए ऐ ओ औ । (2) श ष स ह । (3) ङ ञ ण न । (4) य र ल व ।

2. තාලුජ අකුරු පමණක් ඇති වරණය තෝරන්න.

(1) इ ई च छ । (2) आ ई क ह । (3) ऋ ॠ ज झ । (4) अ आ क ग ।

3. ඥ යන සිංහල අක්ෂරයේ නිවැරදි දේවනාගරී අක්ෂරය වන්නේ,

(1) ञ । (2) ज्ञ । (3) ज । (4) श ।

4. ද්විතීයා විභක්ති බහුවචනයට අයත් පදයක් වන්නේ,

(1) बालकानाम् । (2) पितरः । (3) मृगान् । (4) दुग्धम् ।

5. नेत्र - दुहितृ - अग्रज යන මේවා පිළිවෙළින් අයත් වන ලිංග වන්නේ,

(1) පුරුෂ, ස්ත්‍රී, නපුංසක (2) ස්ත්‍රී, නපුංසක, පුරුෂ (3) ස්ත්‍රී, පුරුෂ, නපුංසක (4) නපුංසක, ස්ත්‍රී, පුරුෂ

6. පියවරුන් යන්නෙහි නිවැරදි සංස්කෘත පරිවර්තනය වන්නේ,

(1) पितरम् । (2) पितॄन् । (3) पितृभिः । (4) पितॄणाम् ।

7. හලන්ත නාමපද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) विहग - मरुत् - चन्द्र । (2) नदी - देवी - राजन् ।
(3) मुनि - रवि - अहि । (4) वाच् - सरित् - राजन् ।

8. लिखाम । යන ආඛ්‍යාත පදය අයත් වන්නේ,

(1) लोट् लकार उत्तमपुरुष बहुवचनम् । (2) लिट् लकार उत्तमपुरुष एकवचनम् ।
(3) लङ् लकार उत्तमपुरुष एकवचनम् । (4) लट् लकार उत्तमपुरुष बहुवचनम् ।


[2 වැනි පිටුව බලන්න.

9. लङ् ලකාර පරස්මෛපද මධ්‍යමපුරුෂ බහුවචන පදය වන්නේ,

(1) अनयन्। (2) अलिखाम। (3) अखादत। (4) लभामहे।

10. हरन्ति - भवेत् යන පද අයත් ලකාර පිළිවෙළින් ඇති වරණය වන්නේ,

(1) लट् - लिट्। (2) लिङ् - लट्। (3) विधिलिङ् - लङ्। (4) लट् - विधिलिङ्।

11. भवानि। යන්නෙහි නිවැරදි සිංහල අර්ථය වන්නේ,

(1) වෙමි. (2) වූවෙමි. (3) වෙම්වා! (4) වන්නෙමි.

12. कस् + शूरः යන්නෙහි නිවැරදි සන්ධි පදය වන්නේ,

(1) कस्शूरः। (2) कश्शूरः। (3) कष्शूरः। (4) कष्षूरः।

13. किमत्र। යන්නෙහි නිවැරදි විසන්ධි පදය කුමක් ද?

(1) किं + अत्र। (2) कः + अत्र। (3) किं + मत्र। (4) किम + अत्र।

14. नयनम्। යන සන්ධි පදය අයත් වන්නේ,

(1) ස්වර සන්ධියට ය. (2) ව්‍යඤ්ජන සන්ධියට ය. (3) අනුස්වාර සන්ධියට ය. (4) විසර්ග සන්ධියට ය.

15. तत्रागतोऽस्मि। වාක්‍යයෙහි ඇතුළත් සන්ධි පද ගණන වන්නේ,

(1) එකකි. (2) දෙකකි. (3) තුනකි. (4) හතරකි.

16. वृक्षलता। යන්න අයත් වන්නේ,

(1) द्विगुसमास। (2) कर्मधारयसमास। (3) द्वन्द्वसमास। (4) तत्पुरुषसमास।

17. තත්පුරුෂ සමාසයට අයත් පදයක් වන්නේ,

(1) प्रबलम्। (2) स्त्रीपुरुषौ। (3) अर्थधर्मौ। (4) राजपुत्रः।

18. धनिक। යන පදය අයත් තද්ධිතය වන්නේ,

(1) සංඛ්‍යාතද්ධිත (2) භාවතද්ධිත (3) අව්‍යයතද්ධිත (4) අස්ත්‍යර්ථතද්ධිත

19. इन ප්‍රත්‍යය එකතු වී සෑදෙන තද්ධිත පදයක් වන්නේ,

(1) मलिनः। (2) गौतमः। (3) धनी। (4) धनिकः।

20. √पा ධාතුවෙන් සෑදෙන පූර්ව ක්‍රියාවක් වන්නේ,

(1) नीत्वा। (2) पिबतु। (3) पीत्वा। (4) पातुम्।

21. ත්‍රෛකාලික කෘදන්ත පදයක් වන්නේ,

(1) दातृ । (2) आनीय । (3) नेतुम् । (4) लिख ।

22. आगत्य යන පදයෙහි නිවැරදි අර්ථය වන්නේ,

(1) ගෙනැවිත් (2) පැමිණ (3) අතහැර (4) නික්ම

23. नन्दन මෙහි ඇති කෘදන්ත ප්‍රත්‍යය තෝරන්න,

(1) अ । (2) अन् । (3) न । (4) अन ।

24. कदापि मातापितरं मा विस्मर । යන වාක්‍යයෙහි නිවැරදි අර්ථය වන්නේ,

(1) සැමදා මව්පියන් සිහිකරන්න.
(2) කවදාවත් මව්පියන් අමතක කරන්න එපා.
(3) සැමදා මව්පියන් වඳින්න.
(4) කවදාවත් මව්පියන් අතහරින්න එපා.

25. "**යම් විටක මම කියම් ද එවිට නුඹ නො කියව**" නිවැරදි සංස්කෘත පරිවර්තනය වන්නේ,

(1) यदा अहं वदामि तदा त्वं न वद ।
(2) यत्र अहं वदामि तत्र त्वं न वद ।
(3) यदि अहं वदामि तर्हि त्वं न वद ।
(4) यदा त्वं वदसि तदा अहं न लिखामि ।

26. " चक्रवत्परिवर्तन्ते दुःखानि च सुखानि च ।" මෙහි නිවැරදි අර්ථය වන්නේ,

(1) සිතිවිලි හා සමාන සිරුර වියළවන දෙයක් නැත.
(2) යහපත් පුද්ගලයෝ කාරුණික වෙති.
(3) සැප දුක් දෙක චක්‍රයක් මෙන් පෙරළේ.
(4) සැප දුක් දෙක සැමට පොදු ය.

27. " मधु तिष्ठति जिह्वाग्रे हृदये तु हलाहलम् । " මෙහි සිංහල අර්ථය කුමක් ද?

(1) දුදනා ප්‍රිය වචන කථා නොකරයි.
(2) දිවග මීපැණි ඇත. හදවතෙහි ඇත්තේ විෂ යි.
(3) සත්පුරුෂයා මීපැණි මෙන් ප්‍රිය වචන කථා කරයි.
(4) සර්පයාටත් වඩා දුදනා දරුණු ය.

28. " शषसहा ऊष्माणः ।" යන සූත්‍රයෙන් හඳුන්වන්නේ,

(1) අන්තඃස්ථ යි. (2) බින්දුව යි. (3) ඌෂ්මාක්ෂර යි. (4) විසර්ගය යි.

29. හිතෝපදේශයේ කොටස් කීය ද?

(1) 04කි. (2) 05කි. (3) 06කි. (4) 07කි.

30. **අපරීක්ෂිතකාරක** නම් කොටස ඇතුළත් වන ග්‍රන්ථය වන්නේ,

(1) ජානකීහරණය (2) කාව්‍යාදර්ශය (3) හිතෝපදේශය (4) පඤ්චතන්ත්‍රය

31. පඤ්චතන්ත්‍රය රචනා වී ඇති කාලය වන්නේ,

(1) ක්‍රි:ව: 400-459 (2) ක්‍රි:ව: 460-465 (3) ක්‍රි:ව: 466-475 (4) ක්‍රි:ව: 476-579

32. ලක්දිව බිහිවූ පළමු සංස්කෘත මහාකාව්‍යය වන්නේ,

(1) පද්‍යචූඩාමණිය යි. (2) රඝුවංශය යි. (3) සෞන්දරනන්දය යි. (4) ජානකීහරණය යි.

33. චාණක්‍යශතකයේ කතුවරයා වන්නේ,

(1) රාමචන්ද්‍ර ය. (2) අශ්වඝෝෂ ය. (3) ශ්‍රී හර්ෂ ය. (4) චාණක්‍ය ය.

34. මහාකවි කලිදසයන් විසින් රචිත මහාකාව්‍යයක් වන්නේ,

(1) බුද්ධචරිතය යි. (2) පද්‍යචූඩාමණිය යි. (3) කුමාරසම්භවය යි. (4) සෞන්දරනන්දය යි.

35. **නෛෂධචරිතය** රචනා කරන ලද්දේ,

(1) ශ්‍රී හර්ෂදේව විසිනි. (2) භට්ටි විසිනි. (3) දණ්ඩින් විසිනි. (4) අශ්වඝෝෂ විසිනි.

36. **महाकोटरं** යන්නෙහි නිවැරදි සිංහල පරිවර්තනය වන්නේ,

(1) මහා බෙනයකි. (2) මහා ගසකි. (3) මහා කොටුවකි. (4) මහා කොටයකි.

37. අමරශක්ති රජුට සිටි නුගත් දරුවන් ගණන කීය ද?

(1) දෙදෙනෙකි. (2) තිදෙනෙකි. (3) සිව්දෙනෙකි. (4) පස්දෙනෙකි.

38. කුමාරසම්භව මහාකාව්‍යයේ සර්ග කීය ද?

(1) 13කි. (2) 17කි. (3) 19කි. (4) 27කි.

39. මහාකවි කාලිදසට පසු ජීවත් වූ මහාකාව්‍ය රචකයෙක් වන්නේ,

(1) ව්‍යාස ඍෂිවරයා යි. (3) වාල්මීකි යි. (3) කුමාරදාස යි. (4) අශ්වඝෝෂ යි.

40. භාරවී විසින් රචිත මහාකාව්‍යය වන්නේ,

(1) කිරාතාර්ජුනීය යි. (2) රාවණවධය යි. (3) හරවිජය යි. (4) ශිශුපාලවධය යි.

[සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 04 | S | II |
|---|---|---|

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

## 04 ශ්‍රේණිය

## (04) සංස්කෘත - II පත්‍රය

පැය තුනයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය ................................

I කොටසේ ප්‍රශ්න **දෙක** සහ II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

01. (i) පහත සඳහන් උද්ධෘත ගද්‍යපාඨ සිංහලයට නගන්න. *(ලකුණු 06 යි.)*

१. मुर्खस्योपकारो न कर्तव्यः ।

.......................................................................................................................................

२. अस्ति कस्मिंश्चिद्वनोद्देशे शमीवृक्षः ।

.......................................................................................................................................

३. तेनाहं समीपगतानपि मत्स्यान्न भक्षयामि ।

.......................................................................................................................................

(ii) පහත සඳහන් උද්ධෘත පද්‍යපාඨ සිංහලයට නගන්න. *(ලකුණු 06 යි.)*

१. पुत्रहीनगृहं शून्यम् ।

.......................................................................................................................................

२. धर्मात् प्रभवते सुखम् ।

.......................................................................................................................................

३. निराहाराः प्रजाः शोच्याः ।

.......................................................................................................................................

02. (i) उद्यमेन हि सिध्यन्ति ।

මෙම ප්‍රකාශයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි.)*

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................



*[2 වැනි පිටුව බලන්න.*

(ii) නිර්දිෂ්ටපාඨ ග්‍රන්ථාගත ගද්‍ය හා පද්‍ය ප්‍රකාශ ආශ්‍රයෙන් පහත සඳහන් මාතෘකා අතුරින් එකක් පිළිබඳ විවරණයක් කරන්න. *(ලකුණු 08 යි.)*

(අ) **"අධික තණ්හාව තමන්ගේ ම විනාශය පිණිස වේ"** පඤ්චතන්ත්‍රයේ ධර්මබුද්ධි පාපබුද්ධි කථාව ඇසුරෙන් විමර්ශනය කරන්න.

(ආ) **"යහපත් ආචාර ධර්ම සමාජගත කිරීමෙහි ලා චාණක්‍ය ශතකයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි."** උදාහරණ සහිත ව විමර්ශනය කරන්න.

## II කොටස

03. (i) **क ह ट त स** යන අකුරු අතුරින් **ඌෂ්මාක්ෂර** තෝරා ලියන්න. *(ලකුණු 02 යි.)*

(ii) පහත සඳහන් **සාරස්වත සූත්‍රවල** තේරුම ලියන්න. *(ලකුණු 04 යි.)*

**१. अवर्जा नामिनः ।**

**२. इचुयशानां तालु ।**

**३. ङञणनमानां नासिका ।**

**४. त्रिमात्रस्तु प्लुतो ज्ञेयो ।**

(iii) (අ) පහත සඳහන් සන්ධිපද විසන්ධි කරන්න. *(ලකුණු 03 යි.)*

१. तद्धित : ....................................................................................................

२. महोदधिः : ....................................................................................................

३. शोकाकूल : ....................................................................................................

(ආ) **दिङ्नागः** / **जलमादाय** / **मयोक्तम्** යන සන්ධිපද සුදුසු පරිදි වගුගත කරන්න. *(ලකුණු 03 යි.)*

| स्वरसन्धि | व्यञ्जनसन्धि | अनुस्वारसन्धि |
|---|---|---|
| | | |

04. (i) **हरि** හා **शाला** යන නාමපද අයත් ලිංග පිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 02 යි.)*

....................................................................................................

(ii) පහත සඳහන් පදවල **විභක්තිය හා වචනය** ලියා දක්වන්න. *(ලකුණු 04 යි.)*

| पद | विभक्ति | वचन |
|---|---|---|
| यतयः | | |
| बुद्धेन | | |
| पितुः | | |
| भानौ | | |

(iii) පහත සඳහන් ආදර්ශ පද රටාව දෙස බලා **හිස්තැනට ගැළපෙන වචනය** ලියන්න. *(ලකුණු 06 යි.)*

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | **कुमारः** | **कुमारौ** | **कुमाराः** |
| द्वितीया | | | भानून् |
| तृतीया | पित्रा | पितृभ्याम् | |
| चतुर्थी | | | उरगेभ्यः |
| षष्ठी | मातुः | मात्रोः | |

05. (i) උදාහරණය ආශ්‍රයෙන් සුදුසු පරිදි වගුව සම්පූර්ණ කරන්න. *(ලකුණු 02 යි.)*

| | |
|---|---|
| උදා : लट् | වර්තමාන කාල |
| विधिलिङ् | |
| लोट् | |

(ii) සුදුසු කෘදන්ත රූපවලින් වගුව සම්පූර්ණ කරන්න. *(ලකුණු 04 යි.)*

| √ नी | √ क्रीड् | √ पठ् | आ + √ दा |
|---|---|---|---|
| तुमन्त | पूर्वक्रिया | तुमन्त | पूर्वक्रिया |
| | | | |

(iii) පහත සඳහන් වගුව සුදුසු පරිදි සම්පූර්ණ කරන්න. *(ලකුණු 06 යි.)*

| आख्यातपद् | लकार | वचन | अर्थ |
|---|---|---|---|
| अगच्छत् | | | |
| पश्यत | | | |

06. (i) कः परः प्रियवादिनाम्। යන පාඨයෙහි ඇති සමාසපදය කුමක් ද? *(ලකුණු 02 යි.)*

..........................................................................................................................................

(ii) सहायता - गौतमः - जटिलः - देवत्वम् මෙම වචන සුදුසු පරිදි වගුගත කරන්න. *(ලකුණු 04 යි.)*

| अपत्यतद्धित | भावतद्धित | अस्त्यर्थतद्धित | समूहार्थतद्धित |
|---|---|---|---|
| | | | |

(iii) පහත දැක්වෙන සමාසපද ඉදිරියෙන් සමාස නාමය ලියන්න. *(ලකුණු 06 යි.)*

| | |
|---|---|
| अनुदिनम् | |
| मद्यपानम् | |
| हस्तपादम् | |
| उपराजम् | |
| ग्रामनिर्गतः | |
| रामलक्ष्मणौ | |

07. (අ) වරහන් තුළ ඇති වචන සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවන්න. (ලකුණු 07 යි.)

( मम / सभामध्ये / किन्तु / मयि / परं / जनाः / मन्दभाग्यः )

भद्र ! किमिदं .................................. निवेद्यते। अहं त्वत्तोऽपि .................................. । त्वं शिरसि .................................. ताड्यसे। मां तु ताडने समर्थाः .................................. पार्श्वद्वयेऽपि हस्ताभ्यां ताडयन्ति। विशेषतश्च विवाहोत्सवादौ .................................. तीव्रं ताडयन्तो मामवजानन्ति। नैकोऽपि मामनुशोचति। .................................. सर्वेऽपि सहर्षं शिरः कम्पयन्तो .................................. ताडनमभिनन्दन्ति।

(ආ) පහත දැක්වෙන ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ලකුණු 05 යි.)

मृगजातौ गजो गरिष्ठः। तस्य पादाः स्तम्भाः इव स्थूलाः। तस्य कर्णौ शूर्पाविव विशालौ। तस्य नेत्रे तावदत्यल्पे। अथापि सोऽल्पान्यपि वस्तूनि द्रष्टुं शक्नोति। भूमौ स्थितां सूचिकामपि स पश्यति गृह्णाति च। अत एव गजस्य शुण्डा '**हस्तः**' इति '**करः**' इति च व्यपदिश्यते। तेन गजस्य '**हस्ती**' '**करी**' इति संज्ञे भवतः। शुण्डैव गजस्य नासिका। तयैव श्वसिति गजः। शुण्डाया अग्रे रन्ध्रमस्ति॥

1. සිවුපාවුන් අතර ඇතා කෙබඳු සතෙක් ද? ..................................................................

2. ඇතාගේ කන් උපමා කර ඇත්තේ කුමකට ද? ..................................................................

3. ඇතා හඳුන්වන පර්යාය නාමයක් ලියන්න. ..................................................................

4. ඇතාට දැකියහැකි හා ගතහැකි කුඩා ම වස්තුව කුමක් ද? ..................................................................

5. ඇතාගේ සොඬය අග ඇත්තේ කුමක් ද?

..................................................................

08. (i) පහත දැක්වෙන වාක්‍ය සිංහලයට පරිවර්තනය කරන්න. (ලකුණු 04 යි.)

१. अहं देशं रक्षामि।

..................................................................

२. तव दूरभाषसंख्यां किम् ?

..................................................................

३. सर्वे जनाः सुखिनः भवन्तु।

..................................................................

४. अनागते कः भवितुम् इच्छसि ?

..................................................................



[6 වැනි පිටුව බලන්න.

(ii) පහත දැක්වෙන වාක්‍ය **සංස්කෘතයට** පරිවර්තනය කරන්න. *(ලකුණු 04 යි.)*

1. ළමයා ගෙදර යයි.

..........................................................................................................................................

2. නුඹලා චිත්‍රය බලවු.

..........................................................................................................................................

3. ඔබ ගුරුවරයා නමදින්න.

..........................................................................................................................................

4. බොහොම ස්තුතියි. නැවත හමුවෙමු.

..........................................................................................................................................

(iii) පහත චිත්‍රය ඇසුරෙන් සංස්කෘත වාක්‍ය හතරක් දේවනාගරී අකුරෙන් ලියන්න.
(එක් වාක්‍යකට වචන තුනක්වත් ඇතුළත් කරන්න. එක ම වචනය දෙවරකට වඩා භාවිත නොකරන්න.)

*(ලකුණු 04 යි.)*



..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................